# බළන්ගොඩ නගර සභා රැස්වීම් වාර්තාව

ස්ථානය : බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව.

දිනය : 2012-07-26

වේලාව : පෙ.ව. 09.00

බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති, ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සභාවේ කටයුතු පවත්වන ලදී.

**සහභාගීත්වය:-**

01. ගරු සභාපති, ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා
02. ගරු උපසභාපති ඩබ්.ඒ.වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා
03. ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා
04. ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා
05. ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්. රූමි මැතිතුමා
06. ගරු නාගරික මන්ත්‍රී එම්. නිමල් කරුණාරත්න මැතිතුමා
07.ගරු නාගරික මන්ත්‍රී ඒ.අසංක නිල්මිණී විජේසිංහ මැතිතුමා
08. ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණ වැවේගෙදර මැතිතුමා
09. ගරු නාගරික මන්ත්‍රී එම්.ජේ.මලීක්ෂා මැතිතුමා

**නිලධාරී සහභාගීත්වය:-**

01. එම්.එච්.සීලවතී මහත්මිය ලේකම්

(01) **ආගම සිහිකිරීම:**

රැස්වීමට පැමිණ සිටි සියළු දෙනා තම තමන්ගේ ආගම සිහිකිරීමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදි.

(02) **ගරු සභාපතිතුමා විසින් කරනු ලබන නිවේදන :**

ගරු සභාපතිතුමා කථාකරමින්, අද දින පවත්වනු ලබන්නේ 2012 වර්ෂයේ ජූලි මාසයට අදාළ මහා සභා රැස්වීම බවත් , ඒ සඳහා සහභාගීවීමට පැමිණ සිටින ගරු උපසභාපතිතුමා, ගරු නාගරික මන්ත්‍රීතුමන්ලා , ලේකම්තුමිය සහ පුවත්පත් කලාවේදී මහතුන් ඉතා ගෞරවයෙන් යුතුව පිළිගන්නා බැව් පැවසීය. මේවන විට සබරගමුව උතුරු මැද හා නැගෙනහිර පළාත් සභා විසුරුවා ඇති බවත්, ඉදිරියේ දී පළාත් සභා මැතිවරණයක් පැවැත්වීමට නියමිත බැවින් මෙම දිනවල මැතිවරණ රාජකාරී කටයුතු බෙහොමයක් යෙදී ඇති බැව් පැවසීය. අතිගරු ජනාධිපතිතුමා යෝධ සංවර්ධන ක්‍රියාවලිය දිවයින පුරා ක්‍රියාත්මක කර ඇති බවත්, එතුමා සිදුකරන මහජන මෙහෙරට කෘතගුණ දැක්වමින් මෙම මැතිවරණයේ දී පළාත් සභා තුනම එක්සත් ජනතා නිදහස් සන්ධානය අතිවිශිෂ්ඨ ලෙස ජයග්‍රහණය කරන බවත් පැවසීය. විශේෂයෙන් රත්නපුර දිස්ත්‍රික්කය සඳහා ඉදිරිපත් වන අපේක්ෂකයින්ගේ ජයග්‍රහණය තහවුරු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බැව් පවසමින් සභාවේ ඉදිරි වැඩ කටයුතු ආරම්භ කරන ලදී.

(03) **2012.06.28 වන දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සත්‍ය වාර්තාවක් බවට සභා සම්මත කිරීම**

2012.06.28 වන දින පැවැති මාසික මහ සභා රැස්වීමේ වාර්තාව සත්‍ය වාර්තාවක් බවට ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් යෝජනා කරන ලද අතර, එම යෝජනාව ගරු උපසභාපති, ඩබ්.ඒ.වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් වාර්තාව සභා සම්මත විය.

(04) **පසුගිය වාර්තාව සමාලෝචනය කිරීම**

වාර්තාව සමාලෝචනය කිරීමක් සිදුනොවීය.

05. **පසුගිය සභාවේ දී ගනු ලැබූ තීරණ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය ඉදිරිපත් කිරීම** :

පසුගිය සභාවේ දී ගනු ලැබූ තීරණ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගති ගරු මන්ත්‍රීතුමන්ලාගේ දැනගැනීම පිණිස සභාවට ඉදිරිපත් කරන ලදී.

06. **සභාවට ලැබී ඇති ලිපි/පෙත්සම්/පැමිණිලි ආදිය ඉදිරිපත් කිරීම :**

06:01 **බළන්ගොඩ බස්නැවතුම්පලේ කඩ කාමරයක් ලබාගැනීම :**

බළන්ගොඩ නව බස්නැවතුම්පලේ කඩ කාමරයක් කුලී ගෙවීමේ පදනම මත ලබාදෙන ලෙස ඉල්ලා බළන්ගොඩ, කෙළින් වීදිය, අංකඃ 60 දරණ ලිපිනයේ පදිංචි වී.පී.එම්.කුලතුංග මහතා විසින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

බස්නැවතුම්පල උඩුමහලේ ඇති අංකඃ 22 දරණ කඩ කාමරය අදාළ හිඟ කඩකුලිය අයකරගෙන ඉහත නම සඳහන් අය වෙත බදුදීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

06:02 **බඩු ගබඩාකර තැබීම සඳහා ස්ථානයක් ලබාගැනීම :**

උක්ත කරුණට අදාළව බළන්ගොඩ, කිරිදිගල අංකඃ 959 දරණ ලිපිනයේ පදිංචි එච්.එම්.දීපිකා නිරංජනී මහත්මිය විසින් ඉදිරිපත් කර ඇති 2012.07.18 දිනැති ලිපිය සභාගත කරන ලදී.

බළන්ගොඩ නව බස්නැවතුම්පලේ විදුලි ජනක යන්ත්‍රය සවිකර තබු ස්ථානය මේවන විට හිස්ව පවතින අතර , එය දිරාපත් වී ඇති බැවින්, එම ස්ථානය බඩු ගබඩා කිරීම සඳහා කුලී පදනම මත ලබාදෙන ලෙස ඉල්ලා තිබිණ.

මාසික කුළිය රු.3000/- ක් හා මාස 03 ක කුළිය තැන්පත් කිරීමෙන් අනතුරුව බදු ගිවිසුමක් අත්සන් කර ලබාදීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

**06:03 ක්ෂේත්‍රයෙන් එකතු කරන ලද හිඟ වරිපනම් සඳහා කොමිස් මුදලක් ලබාගැනීම**

ඉහත සඳහන් කරුණට අදාළව එම්.උපුල් නිශාන්ත මහතා විසින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

ආදායම් අංශයේ ක්ෂේත්‍ර රාජකාරී ආවරණය කිරීම සඳහා තමා යොදා ඇති බවත්, තමන්ට දෛනිකව ලැබෙන වැටුපෙන් ක්ෂේත්‍ර රාජකාරී කටයුතු ඉටුකරන බැවින්, හිඟ වරිපනම් අයකරගැනීමේ දී ඒ සඳහා කොමිස් මුදලක් ලබාදෙන ලෙස එමගින් ඉල්ලා තිබිණ.

පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතියට යටත් කොමිස් මුදලක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

**06:04 පෞද්ගලික බස් ගාස්තු අයකිරීම :**

2012-07-13 වන දින රාජකාරී සඳහා පැමිණීමේ දී ඇති වූ හදිසි අසනීප තත්ත්වය නිසා දින 03 ක පෞද්ගලික බස් රථ වලින් ගාස්තු අයකරගැනීමට නොහැකි වූ බවත්, ඒ සභා වෙනත් අයෙකු යෙදවීමට ද නොහැකි වූ බැවින්, එම දින සඳහා ගාස්තු අයකිරීමෙන් නිදහස් කරන ලෙස ඉල්ලා, එම්.ජී.පියසේන මහතා විසින් ඉදිරිපත් කර ඇති 2012-07-17 දිනැති ලිපිය සභාගත කරන ලදී.

මෙවැනි අවස්ථාවලදී වෙනත් අයෙකු සේවයේ යෙදවීමට නොහැකි නම්, ඒ බව දැනුම් දෙන ලෙස ලිඛිත දැනුම් දීමටත්, අසනීප තත්ත්වය සලකා බලා ඉහත සඳහන් දින 03 ගාස්තුවෙන් නිදහස් කිරීමටත් සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

**06:05 ජල බවුසරය සහ ක්‍රීඩාපිටිය කුළියට ලබාදීම :**

ඉහත සඳහන් කරුණට අදාලව කර්මාන්ත අංශයෙන් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

මෙම නගර සභාව සතු ජල බවුසරය හා ක්‍රීඩාපිටිය නොමිලයේ ලබාදීමෙන් සභාවට ලැබෙන මුදල් අහිමි වී ඇත. ක්‍රීඩාපිටිය සඳහා අයකරන මුදල නගර සභා සීමාව තුළ ඇති පාසල් සඳහා අයනොකිරීමටත් , අනෙකුත් ආයතන සඳහා මුදල් අයකර ලබාදීම සුදුසු බවත්, එමගින් සඳහන් කර තිබුණි.

බළන්ගොඩ ප්‍රදේශයේ තරුණ තරුණියන්ගේ ක්‍රීඩා කෞෂල්‍ය ඉහල නැංවීම සඳහා ක්‍රීඩාපිටිය නොමිළයේ ලබාදීමටත්, ප්‍රදේශයේ විශේෂ අවස්ථාවල දී පමණක් ජල බවුසරය නොමිළයේ ලබාදීමටත්, අනෙකුත් අවස්ථාවලදී නියමිත පරිදි කුළිය අයකර ලබාදීමටත් සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

**06:06 ඉන්ධන සීමාවක් පැනවීම :**

සබරගමුව පළාත් සභාවේ ප්‍රධාන ලේකම්, අභ්‍යන්තර විගණන අංශය හා රජයේ විගණන අංශයේ මූලිකත්වයෙන් සබරගමුව පළාත් සභාවේ පැවැත් වූ විගණන කමිටු රැස්වීමේ දී සියළුම පළාත් පාලන ආයතනවල සභාපතිවරුන්ගේ නිල වාහන සඳහා ඉන්ධන සීමාවක් පනවා ගන්නා ලෙසත්, ඒ සඳහා සභා අනුමැතියක් ලබාගත යුතු බවට උපදෙස් ලබාදුන් බැවින්, ඒ අනුව ඉන්ධන සීමාවක් තීරණය කිරීම සඳහා අනුමැතිය ලබාදෙන ලෙස ඉල්ලා ගණකාධිකාරී මහතා විසින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

මෙම සභාවේ ගරු සභාපතිතුමා විසින් පාවිච්චි කරනු ලබන නිල රථය සඳහා ලීටර් 500 ක ඉන්ධන සීමාවක් පනවා ඇති බැවින්,එම සීමාව ඉදිරියට ද පවත්වාගෙන යාමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

**06:07 ඉරිදා පොලේ අංක: 18 දරණ වෙළඳ කුටිය ලබාගැනීම :**

ඉහත සඳහන් කරුණට අදාළව බළන්ගොඩ ගැමුණු සුභ සාදක එළවළු වෙළඳුන්ගේ සමිතිය විසින් ඉදිරිපත් කර ඇති 2012-07-26 දිනැති ලිපිය සභාගත කරන ලදී.

ගැමුණු සුභ සාධක එළවළු සමිතියේ කාර්යාලීය වැඩ කටයුතු පවත්වාගෙන යාම සඳහාත්, සමිතියේ බඩු භාන්ඩ හා ලිපි ලේඛන ආරක්ෂිතව ලබාගැනීම සඳහාත් ස්ථානයක් නොමැති බැවින් , අපහසුතාවකට ලක්වීමට සිදුව ඇති නිසා ඉරිදා පොලේ අංක: 18 දරණ වෙළඳ කුටිය ඉහත සමිතිය වෙත කුලී ගෙවීමේ පදනමින් නිදහස් කර ලබාදෙන ලෙස එමගින් ඉල්ලා තිබිණ.

ඉහත සඳහන් වෙළඳ කුටිය මුදල් අයකිරීමකින් තොරව ලබාදීමටත්, වෙළඳාම් කටයුතු සඳහා ලබානොදීමටත් මේ සඳහා බදු ගිවිසුමක් අත්සන් කරගැනීමටත් සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

**06:08 පළාත් පාලන ආයතනවල ගරු මන්ත්‍රීතුමන්ලාට සහනදායී යතුරු පැදි ණය ලබාදීම :**

ඉහත කරුණට අදාළව පළාත් පාලන කොමසාරිස් විසින් එවා ඇති ලිපියක් සභාගත කරන ලදී.

යතුරු පැදි ලබාගැනීම සඳහා ණය ලබාදීමේ දී පවතින ගැටළු සහගත තත්ත්වයන් මඟහරවා ගැනීම සඳහා ලබා දී ඇති උපදෙස් සම්බන්ධව එමගින් උපදෙස් ලබා දී ඇති බැවින් එහි සඳහන් කරුණු සම්බන්ධව සභාව දැනුවත් කරන ලදී.

**07. මුදල් ගෙවීම් අනුමත කිරීම : ( රු.10000/- ට වැඩි ගෙවීම් )**

රු.10000/- ට වැඩි ගෙවීම් 2012.07.24 වන දින පැවති මුදල් ප්‍රතිපත්ති හා ප්‍රසම්පාදන කමිටු රැස්වීමට ඉදිරිපත් කල බව වාර්තා කර තිබුණි.

**08. ඇස්තමේන්තු අනුමත කිරීම :**

බළන්ගොඩ නගර සභාවේ පසුභාවිත අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානය ඉදිකිරීමේ කටයුතු වෙනුවෙන් සිදුකරනු ලබන අවසන් ගෙවීමේ දී සැම් ඩෑම් කන්ස්ට්‍රක්ෂන් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනය වෙත අතිරේක වැඩ කොටස් නිමකිරීම වෙනුවෙන් රු.454988.03 ක මුදලක් හා ඊට අදාළ වැට් මුදල සභාවෙන් ගෙවීමට තීරණය විය.

**09. ටෙන්ඩර් මිළ ගණන් සලකා බැලීම :**

09:01 බළන්ගොඩ ප්‍රජා ශාලාව වහල ඉදිකිරීම සඳහා කෙම්පස් වර්ගයේ ලී මිළදී ගැනීම :

| | රෝයල් ටිම්බර් | පොන්සේකා වුඩ්වර්ක්ස් | කැන්ඩි ටිම්බර්ස් | එච්.එල්.පී.ටිම්බර් | සිටි ටිම්බර්ස් |
|---|---|---|---|---|---|
| 4"x3" | 265/- | 270/- | 285/- | 272/- | 270/- |
| 5"x2" | 275/- | 275/- | 275/- | 285/- | 278/- |
| 4"x2" | 165/- | 175/- | 175/- | 175/- | 175/- |
| 2"x2" | 75/- | 75/- | 78/- | 78/- | 78/- |
| 8"x4" | 1000/- | 1200/- | 1150/- | 1100/- | 1100/- |
| 4"x4" | 365/- | 400/- | 400/- | 385/- | 385/- |

අවම මිළ මිළ ගණන් පිළිගැනීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

09:02 බස්නැවතුම්පලෙහි ස්ථාපනය කර තිබු ජෙනරේටරය බළන්ගොඩ තානායමේ ස්ථාපනය කිරීම සඳහා ප්‍රවාහනය කිරීම :

| කේ.වී.සී.ප්‍රඩක්ට් ඇන්ඩ් කන්ස්ට්‍රක්ෂන් | වික්ටරි කන්ස්ට්‍රක්ෂන්ස් | විජේසුන්දර කන්ස්ට්‍රක්ෂන්ස් |
|---|---|---|
| වැට් සහිතව 8400/- | 10640/- | 10000/- |

අවම මිළ ගණන් පිළිගැනීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

10. **යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න** :- නැත

11. **යෝජනා** :

11:01 **ගරු නාගරික මන්ත්‍රී, චමික ජයමිණ වැවේගෙදර මැතිතුමා :**

01. ඇල්ලෙපොල සුසාන භූමියේ පැරණි සුසාන ගෙය කඩා ඉවත්කර අලුතින් එකක් සකස් කිරීම.

02. බළන්ගොඩ පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිතුමා විසින් කෙටි කලක් තුළ නගරයේ ඇතිකල යහපත් තත්ත්වය පිළිබඳ ස්තුතිය පළකිරීම.

මෑතක දී බළන්ගොඩ පොලිස් ස්ථානයේ සඳහා පැමිණි පොලිස්පතිතුමා කෙටි කාලයක් තුළදී බළන්ගොඩ පොලිස් බලප්‍රදේශයේ යම් යම් ස්ථානවල පැවති නීති විරෝධී ක්‍රියාවන් විවිධ දුෂණ වංචා සොරකම් ආදිය සම්පුර්ණයෙන් නතර කිරීමට පියවර ගත් බැව් පැවසීය. බළන්ගොඩ තුඹගොඩ රා තැබෑරුමට පැමිණෙන ජනතාව බීමත්ව ඒ අවට අශෝභන ආකාරයට හැසිරීම නිසා මාර්ගයේ ගමන් කරන පාසල් දරු දැරියන් , මහජනතාව හා රථවාහන වලට විශාල බාධාවක් සිදු වු බැව් පැවසීය. මෙම කාරණය ගරු මන්ත්‍රීවරුන් නිරන්තරව මෙම සභාවේ දී ප්‍රකාශ කල බවත් නමුත් ඒ සම්බන්ධව නිසි පියවරක් ගැනීමට නොහැකි වු බැව් පැවසීය. නමුත් වර්තමාන පොලිස්පතිතුමා මේ කෙරෙහි අවධානය යොමුකර එම තත්ත්වය වෙනස් කිරීමට වහාම පියවර ගත් බැව් පැවසීය. මහජනතාවගේ ආරක්ෂාව හා රථවාහන නිසි පරිදි හැසිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන අදාල ස්ථානයන් හි පොලිස් නිලධාරීන් යොදවමින් ආරක්ෂාව තහවුරු කර ඇති අතර , පොලිස් නිලධාරීන් සියළු දෙනා ද විධිමත් පරිදි රාජකාරිය සඳහා යොදවා ඇති බැව් සඳහන් කරන ලදී. මහජන සුභ සාධන උදෙසා අභිමානවත් ප්‍රශංසනීය සේවයක් ඉටුකරන බළන්ගොඩ පොලිස් ස්ථානාධිපතිතුමන්ට බළන්ගොඩ නගර සභාවේ ප්‍රශංසාව හා ස්තුතිය පළකිරීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

11:02 **ගරු නාගරික මන්ත්‍රී , එම්ජේ.මලීක්ෂා මැතිතුමා :**

01. i. බළන්ගොඩ නගර සභා මහජන පුස්තකාලයට දෙමළ මාධ්‍ය සේවකයෙකු ලබාගැනීම.

ii. පුස්තකාලටය දෙමළ මාධ්‍ය පොත් කට්ටලයක් ලබාගැනීම සදහා මුදල් වෙන්කර ගැනීම.

02. i. බළන්ගොඩ කල්තොට පාරේ බලගහමුල හන්දියේ බස්නැවතුම්පලවල් දෙකම එකළඟ (යන,එන) පිහිටා ඇති බැවින්, වාහන තදබදයක් සහ ජනතාවට අවහිරයක් පවතින නිසා එය වෙනස් කිරීම.

ii. හිටපු පළාත් සභා මන්ත්‍රී විජය නිල්මිණි මැතිතුමාගේ නිවස අසල ඇති බස් නැවතුම්පල හා කහඉරි ද වෙනස් කිරීම.

03. ඔරලෝසු කණුව ළඟින් ඊ.එල්.කඩය දක්වා යන මාර්ගය එක් පැත්තකට පමණක් වාහන ගමන් කිරීමට අවසර දී ඇති බැවින්, එය දෙපැත්තටම වාහන ගමන් කිරීමට සැලසීම.

04. බළන්ගොඩ නගරය අවට සිටින සිටින මුස්ලිම් බැතිමතුන්ගේ රාමසාන් උත්සව කාලය (මාසයක්) ඔවුන් ගේ ආගමික කටයුතු කරගැනීමේ පහසුව සඳහා විථි ලාම්පු කඩිනමින් අලුත්වැඩියා කිරීම.

ඉහත සදහන් යෝජනාව ඉටුකර ඇති බැව් ගරු සභාපතිතුමා විසින් දැන්වීය.

12. **ආදායම් - වියදම් වාර්තා හා අනෙකුත් වාර්තා ඉදිරිපත් කිරීම.**

2012 වර්ෂයේ ජුනි මාසයට අදාළ ආදායම් හා වියදම් වාර්තා සභාවට ඉදිරිපත් කර තිබුණි.

| | |
|---|---|
| පුනරාවර්ථන ලැබීම් | 6,679,619.27 |
| වෙනත් ලැබීම් | 2,117,119.44 |

| | |
|---|---|
| **මුළු ලැබීම්** | **8,796,738.71** |
| පුනරාවර්ථන වියදම් | 5,433,643.70 |
| වෙනත් වියදම් | 3,852,363.60 |
| **මුළු වියදම්** | **9,286,005.30** |

මෙම ආදායම් හා වියදම් වාර්තාව සභාව විසින් අනුමත කරන ලදී.

- බළන්ගොඩ නගර සභා තානායමේ 2012-06-01 සිට 2012-06-30 දක්වා වෙළඳ හා ලාභඅලාභ ගිණුම සභාවට ඉදිරිපත් කරන ලදී.

| | |
|---|---|
| විස්තරය | 2012.06.01 සිට 2012.06.30 දක්වා |
| විකුණුම් | 1,486,927.74 |

| විකුණුම් පිරිවැය | **1,085,727.83** |
|---|---|
| දළ ලාභය | 401,199.91 |
| ශුද්ධ ලාභය/අලාභය | 153,410.96 |

මෙම ලාභඅලාභ ගිණුම සභාව විසින් අනුමත කරන ලදී.

මෙම ඉන්ධන වාර්තා සභාව විසින් අනුමත කරන ලදී.

13. **කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම.**

2012-07-24 වන දින පැවති තානායම් කමිටු රැස්වීමේ වාර්තාව, 2012.07.24 වන දින පැවති මුදල් ප්‍රතිපත්ති හා ප්‍රසම්පාදන කමිටු රැස්වීමේ වාර්තාව, නාගරික සංවර්ධන පුවත් එකතුව සකස් කර ඇති 2012 ජුලි ( 1 කාණ්ඩය 08 කලාපය) අරුණළු සඟරාව හා බළන්ගොඩ නගර සභා ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථානය විසින් සකස් කර ඇති ජීවක අසපුව මාසික ආයුර්වේද සංග්‍රහය සභාවේ අනුමැතියට සඳහා ඉදිරිපත් කර තිබුණි.

මෙම වාර්තාවන් සඳහා සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

14. **වෙනත් කරුණුඃ**

14:01 **ගරු උපසභාපති, ඩබ්.ඒ.වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා ඃ**

ගරු උපසභාපතිතුමා කථාකරමින්, මගනැගුම,ගම නැගුම, ජාතික සවිය වැනි සංවර්ධන යෝජනා දිවයින පුරා ක්‍රියාත්මක වන අතර, එම සංවර්ධන ව්‍යාපෘතීන්හි වැඩ අවසන් කිරීමෙන් අනතුරුව ව්‍යාපෘතියේ විස්තර දැක්වෙන දැන්වීම් පුවරුවක්( ඡායා රූප ද සමග) සවිකරන බව පැවසීය. පසුගිය දිනවල සිට එම දැන්වීමට ඡායාරූප ඇතුළත් නොකරන ලෙස ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් දැන් වු බවත්, මේ හේතුව නිසා මහජන නියෝජිතයින්ගේ ඉල්ලීම අනුව සිදුකරන සංවර්ධන ව්‍යාපෘති කෙරෙහි ජනතාව දැනුවත්මක් සිදුනොවන බැව් පැවසීය. එම නිසා මහජන නියෝජිතයින් පත්වන අපහසුතාව සම්බන්ධව ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු රැස්වීමේ අවධානය යොමුකරන ලෙස ඉල්ලීමක් කරන ලදී.

බළන්ගොඩ පොලිස් ස්ථානාධිපතිතුමා ඉතා කැපවීමෙන් හා උනන්දුවෙන් යුතුව මහජන සුභසාධනය උදෙසා කරන කටයුතු අගය කල යුතු බවත්, නමුත් නීතිය ක්‍රියාත්මක කිරීමේ දී පුද්ගලයාගේ තරාතිරම නොසලකා නීතිය සැම දෙනාටම එක හා සමානව ක්‍රියාත්මක කිරීමට එතුමා කටයුතු කල යුතු බැව් පැවසීය.

15. **අවසානය.**

අද දින සභාවේ වැඩ කටයුතු සාර්ථක කරගැනීමට සහයෝගය ලබාදුන් ගරු උපසභාපතිතුමා ඇතුළු ගරු නාගරික මන්ත්‍රීතුමන්ලාට සිය ස්තූතිය පළකරන අතර, ඉදිරි පළාත් සභා මැතිවරණයේ බළන්ගොඩ නගරය තුළ පොලිතීන් වලින් කෙරෙන සැරසිලි නොකරන ලෙසත් පක්ෂ භේදයෙන් තොරව සහයෝගීව මැතිවරණ කටයුතු ඉටුකරමු යැයි සැම දෙනාගෙන්ම ඉල්ලා සිටින බවත් පැවසීය. එසේම මෙම රාමසාන් උත්වස කාලයේ දී මුස්ලිම් බැතිමතුන්ට සිය ආගමික වතාවත් ඉටුකරගැනීමට අවශ්‍ය පහසුකම් සලසා ඇති බවද අවධාරණය කරමින් සභාවේ වැඩ කටයුතු පෙ.ව.10.00ට පමණ අවසන් කරන ලදී.

ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ,
සභාපති,
බළන්ගොඩ නගර සභාව.